ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/7/13/2/1-VOL 01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.11.12.02 |

දකුණු පළාතේ සියලුම,
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා,
ගණන්දීමේ නිලධාරීන් වෙත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සම්බන්ධව දැනුම් දීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022.10.28 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 (I) හා බැදේ. එය දකුණු පළාත් සභාවට අදාල කර ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය **2022.11.15** වන දින ලබා දුන් බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක: G/SP/1/1/2/2022 දරණ 2022.11.17 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති බව කාරුණිකව දැනුම් දෙමි. ( ලිපි පිටපත් අමුණා ඇත).

02. මාගේ අංක : CSS/7/13/2/1 හා 2022.01.31 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි මෙම චක්‍රලේඛය, ප්‍රධාන ලේකම් කාර්යාලීය වෙබ් අඩවියේ මුදල් දෙපාර්තමේන්තුව යටතේ "ගරු ආණ්ඩුකාර තුමා විසින් දකුණු පළාතට අදාල කර ගැනීම සඳහා අනුමත කරන ලද චක්‍රලේඛ" යන්නෙහි ඇතුලත් කර ඇති බැවින් එය භාගත කිරීම සිදු කල හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්- 1. සහකාර විගණකාධිපති, දකුණු පළාත
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත

දුරකථන - 091 - 4944007
ෆැක්ස් - 091 – 2232691
විද්‍යුත් ලිපිනය - depoffinance7@gmail.com

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
ஆளுநர் செயலகம் - தென் மாகாணம்
Governor's Secretariat - Southern Province

360

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Number | G/SP/1/1/2/2022 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2022/11/17 |

ලැබුණා
22 NOV 2022
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

21/11/22

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020(I) දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම)**

උක්ත ශීර්ෂයෙන් යුක්තව මා වෙත යොමු කරන ලද ඔබේ අංක CSS/7/13/1 හා 2022.11.08 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් යොමු කරන ලද, 2022.10.28 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020(I) දරන චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා **2022.11.15** දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

දීපිකා කේ.ගුණරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.